# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.11.03 පැය 0540 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1980/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>**

**01. වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් - හොරණ පොලිස් වසම.**

2025.11.02 වන දින රාත්‍රී කාලයේ හොරණ පොලිස් වසමේ මීවනපලාන ප්‍රදේශයේදී සිදු කල වෙඩි තැබීමකින් පුද්ගලයෙකු මියගොස් ඇති බවට හොරණ පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 45 ක් වූ මීවනපලාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය හොරණ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. පුද්ගලික ආරවුලක් මත මෙම වෙඩි තැබීම සිදුකර ඇති බවත්, වෙඩි තැබීම සඳහා බෝර 12 වර්ගයේ ගිනි අවියක් භාවිතා කර ඇති බවටත් දැනට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. සැකකරු වයස අවුරුදු 45 ක් වන මීවනපලාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන අතර ඔහු අත්අඩංගුවට ගැනීම සඳහා හොරණ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. රාජකාරියට බාධා කිරීම සම්බන්ධයෙන් සැකකරුවන් 05 ක් හා සැකකාරියන් 05 ක් අත්අඩංගුවට - රාමනාදපුරම් පොලිස් ස්ථානය.**

2025.11.02 වන දින උදෑසන කාලයේ රාමනාදපුරම් පොලිස් වසමේ සුඩලකුලම් ප්‍රදේශයේදී කිළිනොච්චිය පොලිස් විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් කණ්ඩායමක් නීති විරෝධි මත්පැන් වැටලීමක් සිදු කර සැකකරුවෙකු අත්අඩංගුවට ගත් අවස්ථාවේ යකඩ පොලු හා ලී පොලු රැගෙන පැමිණි පිරිසක් විසින් නිලධාරීන්ට පහරදී සැකකරු මුදවා ගෙන එම ස්ථානයෙන් පලාගොස් ඇත.

පහරදීමෙන් තුවාල ලැබූ පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් දෙදෙනෙකු කිළිනොච්චිය රෝහලේ ප්‍රතිකාර ලබන අතර රාමනාදපුරම් පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් නිලධාරීන්ට පහරදීම සම්බන්ධයෙන් සැකකරුවන් 05 දෙනෙකු හා සැකකාරියන් 05 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 16 ත් 32 ත් අතර හා සැකකාරියන් අවුරුදු 26 ත් 45 ත් අතර වයස්වල පසුවන රාමනාදපුරම් ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

සැකකරුවන් හා සැකකාරියන් 2025.11.03 වන අද දින කිළිනොච්චිය ගරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතය. රාමනාදපුරම් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03.** **බලපත්‍ර නොමැතිව මැණික් ගැරූ සැකකරුවෙකු අත්අඩංගුවට - මස්කෙළිය පොලිස් ස්ථානය.**

2025.11.02 වන දින දහවල් කාලයේදී මස්කෙළිය පොලිස් වසමේ මස්කෙළිය වත්ත ප්‍රදේශයේදී මස්කෙළිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර බලපත්‍ර නොමැතිව අනවසරයෙන් මැණික් ගරමින් සිටි සැකකරුවෙකු කැණීම් උපකරණ සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 62 ක් වන මස්කෙළිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මස්කෙළිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04.** **මාරක රිය අනතුරක් - කිතුල්ගල පොලිස් වසම.**

2025.11.02 වන දින දහවල් කාලයේ කිතුල්ගල පොලිස් වසමේ හැටන් කිතුල්ගල මාර්ගයේ 39 වන කිලෝමීටර් කණුව අසලදී කිතුල්ගල දෙස සිට හැටන් දෙසට ධාවනය වූ කාර් රථයක් ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි යතුරුපැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදිකරු බරපතල තුවාල ලබා තැලිගම රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 44 ක් වූ කිතුල්ගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය තැලිගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර කිතුල්ගල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**